# සාරාංශය


"සිංහල භාෂාව හා සාහිත්‍යය" ජාතියේ ජීවයයි. එය එසේ වුව ද පාසල් පද්ධතිය තුළ පාසලේ විෂයමාලාවේ අඩු අවධානයක් යොමු වී ඇත්තේ ද මේ වෙතටය. සිංහල ජාතිය මෙන් ම භාෂාව ද ලෝකයෙන් තුරන් වී යාමේ කාලය ඉතාමත් ම ආසන්න ය. භාෂා හසුරු කුසලතාව සමාජයෙන් ඈත්වෙමින් පවතින අතර එය පාසල් පද්ධතිය වෙතට ද කාන්දු වීම සඳහා ජනමාධ්‍ය බෙහෙවින් ම බලපා ඇත. සමාජය, භාෂාව හා එහි අනන්‍යතාව නොසලකා හරින විට එය පාසල් විෂයමාලාව තුළ ද නොසලකා හරිනු ලැබූ විෂයක් බවට පත් වී ඇත. ඒ නිසා ම භාෂාව හා සාහිත්‍යය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු කාලය එළඹී ඇති බව දක්නට ලැබේ.

වසර ගණනාවක විභාග ප්‍රතිඵල, ඇගයීම් වාර්තා අධ්‍යයනය කළ පර්යේෂිකාවට මෙම විෂයෙහි පසුබෑම මැනවින් පැහැදිලි විය. ඒ නිසා ම ඇය නවත ම ඉගැන්වීම් ක්‍රමයක් අත්හදා බැලීම මඟින් සිසුන් මේ සඳහා යොමු කිරීමට යම් උත්සාහයක් දරනු ලැබීය. හුණු පුවරුවත්, සම්ප්‍රදායික පංති කාමරයත්, කට පාඩම් කරගන්නා විෂය නිර්දේශයත්, දරුවා යාන්ත්‍රික කරනවා විනා නිර්මාණශීලි පුද්ගලයෙකු බිහි නො කරයි. ඒ නිසා ම ඇති වූ අත්දැකීම් පදනම් කර ගනිමින් පර්යේෂිකාව මෙම අධ්‍යයනය සඳහා යොමු වන ලදී.

ඒ අනුව අධ්‍යයනයේ පළමු පරිච්ඡේදයෙන් ගැටලුව හැඳින්වීමත්, මාතෘකාවට අදාළ න්‍යායාත්මක පසුබිම පිළිබඳ විමර්ශනය සඳහාත් පර්යේෂිකාව වෙන් කර ගන්නා ලදී.

දෙවන පරිච්ඡේදයේ දී පර්යේෂිකාව විසින් ගැටලුවට අදාළ පූර්ව සාහිත්‍යය පිළිබඳ ව විමර්ශනය කරන ලදී. පර්යේෂිකාවගේ පර්යේෂණ ක්ෂෙත්‍රයට සෘජු ලෙස ම සම්බන්ධ වූ පර්යේෂණ සාහිත්‍යය එහි දී ඇයට සොයාගත හැකි වුයේ අල්ප වශයෙනි. එහෙත් සෘජු ලෙස ම අදාළ නො වුව ද එම ක්ෂෙත්‍රයට අදාළ එහෙත් ඊට ආසන්න ක්ෂෙත්‍ර පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයන් ගෙන් ලබා ගත් දත්ත ඇගේ පර්යේෂණ කාර්යය සඳහා මඟ සකසා ගැනීමට උදව් වූ බව සඳහන් කළ යුතුය.

තුන්වන පරිච්ඡේදයේ දී අධ්‍යයනයේ පසුබිමත්, එහි වැදගත්කම හා සීමා පිළිබඳ ව විස්තර කරනු ලැබ ඇත. ඉන් අනතුරුව ඇය විසින් විග්‍රහ කරනු ලැබ ඇත්තේ අධ්‍යයන ක්‍රමවේදය යි. අධ්‍යයනයේ අරමුණු, දත්ත එක් රැස් කළ ආකාරය, උපකරණ, නියැදිය, දත්ත විශ්ලේෂණ ක්‍රම ශිල්ප ආදීයෙහි තොරතුරු ද එහි දී ම විස්තර කරනු ලැබ ඇත.

කාර්ය මූලික පර්යේෂණ ක්‍රමය යටතේ සිදු වූ මෙම අධ්‍යයනය අරමුණු පහක් ඔස්සේ ක්‍රියාත්මක විය. එහි දී 11 ශ්‍රේණියේ සිසුන්ගේ සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ව විෂය නිර්දේශ හා ප්‍රශ්න පත්තරවල අන්තර්ගතය ආශ්‍රය කර ගනිමින් ඔවුන්ගේ දැනුම් මට්ටම් පිළිබඳ ව විමසීමකට ලක් කෙරෙණි. අනතුරුව සිසුන් ලබා ගත් ලකුණු මට්ටම් අනුව ඔවුන් කොටස් දෙකකට කාණ්ඩ කරන ලදී. අනතුරුව කණ්ඩායම් දෙකේ සිසුන්ගේ දැනුම් මට්ටම් පදනම් කර ගනිමින් නවත ම අත්හදා බැලීමේ ඉගැන්වීම් ක්‍රමය 2005 ජුනි මාසයේ සිට ආරම්භ කරන ලදී.

හතර වන පරිච්ඡේදයේ දී විවිධ උපකරණ භාවිතයෙන් ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය සඳහා වෙන් කරන ලදී. එහි දී වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර ගන්නා ලදී. පවත්නා විෂය නිර්දේශය තුළ පෘථුල පරාසයක් ආවරණය කිරීමට සිදු වීම ද, පාසලේ කාලච්ඡේද අටක කාල සීමාව තුළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා වෙන් වී ඇති කාලච්ඡේදයන්හි දී එම විෂය පරාසය සරලව සිසුන්ට අවබෝධ කරවීමට ප්‍රමාණවත් නොවීම ද, සම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවල පවත්නා නිරස බව ද සිසුන්ට දැනුම භාවිතයට ගැනීමට ලැබෙන එක ම අවස්ථාව විභාගය වීම ද පාසලේ අනෙකුත් විෂයමාලාව සමඟ සසඳන කල සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා ලැබෙන අවධානය අවම වීම ද පර්යේෂිකාව මෙම අධ්‍යයනයේ දී හඳුනා ගනු ලැබිය.

"භාෂාව හා සාහිත්‍යය" විෂයෙහි පවත්නා ස්වභාවයෙන් ඔබ්බට ගෙන යාම සඳහා කළ පර්යේෂණයෙහි දත්ත අසුරින් අර්ථකථන, නිගමන හා යෝජනා ඉදිරිපත් කර ගන්නා ලදී.

මෙම අධ්‍යයන ක්‍රියාදාමය සාර්ථක වීම සඳහා "සිංහල භාෂාව හා සාහිත්‍යය" ගුරුවරයා පමණක් නොව පාසලේ සියලු ම ගුරු භවතුන්ගේ ද අවධානය අවශ්‍ය වන අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද බාහිර පොතපත පරිශීලනය සඳහා යොමු වීම ද ජන සන්නිවේදන මාධ්‍යය හා සමාජයේ කැප කිරීම ද රාජ්‍ය අංශයේ මැදිහත් වීම ද මේ සඳහා නො අඩුව ලැබෙන්නේ නම් අඩු ම වශයෙන් තම එදිනෙදා අවශ්‍යතා සඳහාවත් බස මැනවින් හැසිරවිය හැකි සිසු පිරිසක් අනාගත පරපුර ලෙස රටට දායාද කළ හැකි බව පර්යේෂිකාවගේ නිගමනය වී පැවතුණි. එහිදී ඇය වැඩිදුරටත් පවසමින් යෝජනා කර සිටින්නේ සෑම භාෂා ගුරුවරයෙක් ම නිර්මාණශීලි වීම දරුවාගේ බස ග්‍රහණ කර ගැනීමේ හැකියාව වර්ධනය වන බවයි.